# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1152/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 13/07/2024<br>පැය 1515 |

# මුල්ලේරියාව පොලිස් ස්ථානයට නව කාන්තා භට නිවස්නයක්

පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍යමය දායකත්වයෙන් මුල්ලේරියාව පොලිස් ස්ථානයේ ඉදිකරන ලද නව කාන්තා භට නිවස්නය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් 2024.07.13 වන අද දින උදෑසන යෙදුණු සුබ මොහොතින් විවෘත කරන ලදි.

රුපියල් ලක්ෂ 40 කට අධික මුදලක් පොලිස් ත්‍යාග අරමුදලෙන් වැය කරමින් ඉදිකරන ලද මෙම මෙම කාන්තා භට නිවාසයට ශ්‍රම දායකත්වය පොලි ඩ්‍රයිව් ආයතනය, එම්පයර් ටී ආයතනය, බැවුල ටී ආයතනය හා මණ්ඩාවිල කර්මාන්තපුරයේ සංවර්ධන සමිතිය විසින් ලබාදී ඇත.

මෙම අවස්ථාවේදී මුල්ලේරියාව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් යුක්තිය මෙහෙයුමට අදාලව සිදුකරන ලද සාර්ථක වැටලීම් වෙනුවෙන් එම නිලධාරීගේ සේවය අගයා ඔවුන් වෙත හා එය සාර්ථක කර ගැනීම සඳහා උරදුන් ප්‍රජා කමිටු සමාජිකයින් වෙත පොලිස්පතිතුමා විසින් සහතිකපත් පිරිනමන ලදි. මෙයට සමගාමීව මෙම ප්‍රදේශයේ දහම් පාසැල් අධ්‍යාපනය ලබන සිසු දරුදැරියන් වෙනුවෙන්ද ත්‍යාග පිරිනැමීමක් සිදුකරන ලදී. පොලිස් නිලධාරීන්ගේ සුබසාධනය වෙනුවෙන් දිවයිනේ සියළුම පොලිස් ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පොලිස්පතිතුමාගේ අවදානය යොමුව ඇත.

මෙම අවස්ථාව සඳහා කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් ප්‍රියනාත් පෙරේරා, කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රදේශීය ලේකම් සිරිවර්ධන, බස්නාහිර පළාත් ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න, කොළඹ දකුණ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති මාරපන යන මහත්වරුන් ඇතුළු පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.














BANK OF CEYLON
BOC
Bankers to the Nation






**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**